

# The Wind That Shakes The Barley



**127mins/UK/Color/2006/political** අධ්‍යක්ෂණය- **Ken Loach**

19 වන සියවසේ අයර්ලන්ත කවියෙකු වූ Robert Dwyer Joyce විසින් රචිත අයර්ලන්ත දේශප්‍රේමී ජන ගීයක් චිත්‍රපටයේ නම සඳහා යොදාගෙන තිබේ. මෙයට පසුබිම් වන්නේ 1919 සිට 1921 තෙක් ඇදී ගිය අයර්ලන්ත නිදහස් අරගලයත්, එම අරගලයෙන් පසුව අයර්ලන්තය තුළ පැවති (1922-23) සිවිල් යුද්ධයත්ය. චිත්‍රපටය ආරම්භ වන මොහොතේ අයර්ලන්ත දේශප්‍රේමී අරගලයට අධ්‍යක්ෂවරයා පක්ෂග්‍රාහීව කටයුතු කරන්නේ යැයි අපට දැනී ගිය ද මඳ වෙලාවක් යනවිට එම සටනේ ඉතාම සංකීර්ණ හා ලේවැකි පැතිකඩවල් මිථ්‍යාකරණය නොකොට අප වෙත නිරාවරණය කිරීමට ඔහු සමත් වේ. එක පැත්තකින් මෙය ඉරාකය හා ගනුදෙනු කරන ඇමරිකානුවන් හා බ්‍රිතාන්‍යයින් පිළිබඳ අපට යළි සිහිකැඳවීමක් කරන්නකි.

‘සුළඟට සැලෙන බාර්ලි’ නම් මෙම චිත්‍රපටය 2006 වසරේ කෑන් සම්මාන උළෙලේ ‘රන් කැමරා’ සම්මානයෙන් පිදුම් ලැබුවාය.

වෛද්‍ය ශිෂ්‍යයෙකු වන ඩේමියන් සිය අධ්‍යාපන කටයුතුවල නිමාවක් දැකීමට ලන්ඩන් නුවර බලා පිටත්වීමට සූදානම්ව සිටී. ඔහුගේ සෝයුරා වන ටෙඩී අයර්ලන්ත රිපබ්ලිකන් හමුදාවේ ක්‍රියාකාරී සාමාජිකයෙකි. අවුරුදු 700 ක පමණ



කාලයක් පුරා ආක්‍රමණකාරී බ්‍රිතාන්‍ය හමුදා ආධිපත්‍යයට ලක්ව තිබෙන අයර්ලන්තයේ ක්‍රියාකාරීව සිටින බ්‍රිතාන්‍ය හමුදාවන්ට සහයෝගය දක්වන අතුරු හමුදා කණ්ඩායම්වල නිරන්තර පීඩනයට හා දාමරිකකම්වලට මුහුණ දීමට අයර්ලන්ත වැසියන්ට සිදුවේ. ඩේමියන්ට ද මෙම හමුදා මගින් කරන නොපනත්කම් අත්දැකීමට ලැබේ. සිය වෛද්‍ය අධ්‍යාපනය පසෙක තබා මව්බිමේ නිදහස වෙනුවෙන් සටන් වැදීමට ඔහු තීරණය කරයි. බ්‍රිතාන්‍යයින්ට එරෙහිව ගරිල්ලා සටන්වල නිරතවීමට අදිටන් කරගත් ඔහු සිය සොයුරා සොයා ගොස් IRA සංවිධානය හා එක්වෙයි. මේ අතර සාම ගිවිසුමකට එළඹීමට සටන් වැදි දෙපාර්ශවය යොමු වේ. සාම ගිවිසුම සහෝදරයින් දෙදෙනා දෙපසකට කරලයි. දෙදෙනා තමා යා යුතු මාවත සොයා ගත යුතුය. ටෙඩී අයර්ලන්ත නව නිදහස් රජය සංවිධානය කිරීමටත් සාමය සඳහා අනුමැතිය ලබා දීමටත් තීරණය කරයි. ඩේමියන් ඇතුළු දේශප්‍රේමීන්ට මේ සාමය ඔවුන් සටන් වැදුණු පරමාර්ථය නොවේ. ඔවුන්ට මේ සාම ගිවිසුම වනාහි ධජයේ වර්ණය පමණක් වෙනසකට බඳුන් කළ එක පමණකි. නමුත් ගිවිසුම පිළිබඳ සිය මතය පිළිගැනීමට නව රජය බලහත්කාරය ක්‍රියාවේ යොදවයි.

අයර්ලන්ත නිදහස් රජයේ හමුදාව හා ගිවිසුම් විරෝධී IRA හි ප්‍රචණ්ඩත්වය සමාන වන්නේ මුලදී ආක්‍රමණකාරී බ්‍රිතාන්‍ය හමුදාව හා අයර්ලන්ත ගරිල්ලා කණ්ඩායම් අතර තිබූ ප්‍රචණ්ඩ සටනටය. දැන් අයර්ලන්තයේ නිල ඇඳුම් ඇඟලා ගෙන සිටින්නේ අයර්ලන්ත ජාතිකයින්මය. සාමයේ ආයුෂ ඉතා කෙටිය. ප්‍රචණ්ඩත්වය එදා තිබූ ප්‍රචණ්ඩත්වයමය. අයර්ලන්ත වැසියන් එරෙහි වූයේ අයර්ලන්ත වැසියන්ටමය- සහෝදරයින් එරෙහි වූයේ සහෝදරයින්ටමය. ටෙඩී එරෙහි වූයේ ඩේමියන්ටය.